www.kidworship.kr

# ජෝෂුවා

– 17th Story–



115Page

**පොතේ ගුරා** මෝසෙස් ඉශ්රායෙල් ජනතාව මඟ පෙන්වමින් යන ගමනේ දී කානාන් දේශයට ඇතුල් වන්නට කලින්ම මිය ගියා.
මේ අවස්ථාවේ දී දෙවියන්වහන්සේ අලුත් කෙනෙකු නායකත්වයට පත් කරනු ලැබුවා. ඔහුගේ නම යෝෂුවා ය.

**දෙවියන්වහන්සේ** ශක්තිමත්ව ධෛර්යමත්ව සිටින්න. මම මෝසෙස් සමග සිටියාක් මෙන්ම නුඹ සමගත් සිටින්නෙමි. මෝසෙස්ට දිවුල දේශය මම නුඹට දෙන්නෙමි.

..............................................................................................



116Page

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ යෝෂුවාට දුන් පොරොන්දුව හේතුවෙන් ඔහු ශක්තිමත්ව හා ධෛර්යමත්ව සිටියා.
යෝෂුවා යෙරිකෝවට ඔත්තුකාරයන් දෙදෙනෙකු පිටත් කර හැරියා.
මේ අවස්ථාවේ යෙරිකෝවේ සිටි රාහබ් නම් කාන්තාවක් මේ ඔත්තුකාරයන් දෙදෙනාට උදව් කළා.


**හේවායෙක්** භයානකයි !! ඔහ්.... ඉශ්රායෙල්හි ඔත්තුකාරයන් අපේ දේශය ඇතුළට ඇවිත්.

**පොතේ ගුරා** ඉශ්රායෙල්හි ඔත්තුකරුවන් යෙරිකෝව තුළ සිටින බව ඇසූ යෙරිකෝ රජතුමා, තද කෝපයට පත් වී ඔවුන් අල්ලා ඔහු ළගට ගෙනෙන ලෙස අණ කළා. නමුත් රාහබ් ඔවුන්ට පලා යාමට උදව් කළා.

**රාහබ්** මම ඔබලාට කරුණාව දැක්වූවා වගේම, ඔබලා යෙරිකෝව අල්ලාගන්-නට එද්දී මමත් මගේ පවුලේ අයත් මරණයෙන් ගළවන්න කියා මම ඉල්ලනවා.

**පොතේ ගුරා** ඔත්තුකාරයන් එම පොරොන්දුව ඉටු කරන පිණිස සහතික කරමින් යෙරි-කෝවෙන් ආරක්ෂාකාරීව පලා ගියේය.

..............................................................................................



117Page

**පොතේ ගුරා** වසර 40 ක් කාන්තාරයේ ඇවිද ආ ඉශ්රායෙල්වරු අවසානයේ දී දැන් දෙවියන්වහන්සේ පොරොන්දු වූ කානාන් දේශය ඉදිරිපිට යෝර්දාන ගංගාව ළග නතර වී සිටියි.
නියමය අනුව ඔවුන් කානාන් වලට ඇතුල්විය යුත්තේ යෝර්දාන් ගංගාව තරණය කිරීමෙනි. නමුත් ගංගාවෙන් එතෙරට යාමට ඔවුන්ට බෝට්ටු හෝ පාලම් තිබුණේ නැත. එසේම බලවත් රැළි හරහා එතෙරට යාමත් ඔවුන්ට මහත් අසීරුවක් වුණා.

**මිනිසා** (යෙරිකෝව වෙතට අත දිගු කර) ඕහ්... අපි කොහොමද එතැනට යන්නේ ?

**කාන්තාව** මේක නම් කෙහොමටවත් කරන්න බැරි වෙයි.

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ යෝෂුවාට කතා කළ සේක.

දෙවියන්වහන්සේ: සියලු ඉශ්රායෙල්වරුන්ගේ ඇස් ඉදිරියේ මම ඔබව අද උසස් කරමි. මම මෝසෙස් සමග සිටියාක් මෙන් නුඹ සමගත් සිටින බව මෙයින් ඔවුන් දැන ගන්නවා ඇත. ගිවිසුම් පෙට්ටිය ඔසවාගෙන යෝර්දාන් ගඟ ඉදිරියේ සිටගන්න පිණිස පූජකයන්ට දන්වන්න.
එසේ කරන විට ඔවුන්, ගංගාව නතර වෙනු ඇත.

පොතේ ගුරා: එවිට පූජකයන් ගිවිසුම් පෙට්ටිය ඔසවාගෙන ඇවිත් ඔවුන්ගේ පා ජෝර්දාන් ජලයේ තබන විටම පුදුමයකි !
යෝර්දාන් ගංගාවේ ජලය නැවත එක ගොඩක් වී සිටියේය.
එවිට ඔවුන් යෝර්දාන් මැද වියළි භූමිය පිට ඇවිද ගියෝය.

යෝෂුවා: දැන් ඔබලා පරිස්සමින්. කවුරුත් තල්ලු කරන්න එපා. වෙලාව අරන් හෙමින් යන්න.

කාන්තාව: හලේලූයා... ! දෙවිඳුන්ට ප්‍රශංසා වේවා !

මිනිසා: මට නම් හිතාගන්න බෑ. රතු මුහුද ළඟදී මම අත්දැකපු දේම මෙතැනින් මට අත්දකින්න පුලුවන් වුණා... මේක නම් මහ පුදුමයක්.

පොතේ ගුරා: ඔවුන්ගේ මුතුන් මිත්තෝ රතු මුහුද මැදින් ගමන් කළා වගේම, මේ ඉශ්රායෙල්වරු බොහෝම සුරක්ෂිතව ජෝර්දාන් ගංගාව මැදින් ඇවිදගෙන ගියා.

................................................................................


118Page

පොතේ ගුරා: යෙරිකෝව ඉදිරියේ සිටි යෝෂුවා සමග දෙවියන්වහන්සේ කතා කළා.


දෙවියන්වහන්සේ: ඔබ යෙරිකෝව ජයග්‍රහණය කළ යුතුයි. මේ උදෙසා ඔබ ඔබගේ හමුදාව සමඟ නගරය වටේ ඇවිද යා යුතුයි. පූජකයන් හොරණෑව ගෙන ගිවිසුම් පෙට්ටියට පෙරටුව යා යුතුයි. නමුත් අන් සියලුදෙනා නිෂ්ශබ්දව සිටිය යුතුයි. 7 වෙනි දවසේ 7 වතාවක් නුවර වටේට යා යුතුයි.
පූජකයන් හොරණෑ පිඹිමින් යා යුතුයි. අන්තිම හොරණෑව පිඹින විටදී මුලු සමූහයා ඔල්වරසන් දී කෑ ගැසිය යුතුය. ඒ වෙලාවේ යෙරිකෝ පවුර කඩා වැටෙනු ඇත.

පොතේ ගුරා: යෝෂුවා ඉශ්රායෙල්වරුන්ට කතා කළා.

යෝෂුවා: ඔබලා සියලුදෙනාම නගරය වටේටම අපි ඇවිද යද්දී නිශ්චලව නිෂ්ශබ්දව සිටිය යුතුයි. නමුත් මම කියන විටදී සියලු දෙනා එක්වර ඔල්වරසන් දී කෑ ගැසිය යුතුයි.

පොතේ ගුරා: දින 6 ක් පුරා ඉශ්රායෙල් ජනතාව දෙවියන්වහන්සේට කීකරුව නගරය වටේටම ඇවිදගෙන ගියා.

................................................................................


119Page

පොතේ ගුරා: අවසානයේ දී 7 වෙනි දවස ආවා. ඉශ්රායෙල්වරු නගරය වටා 7 වතාවක් ඇවිදගෙන ගියා. පූජකවරුන් හොරණෑව පිඹිමින් ගියා. 7 වෙනි වතාවේ දී මහත් හඬින් ඔල්වර හඬ නැගුවා.

යෝෂුවා: හැමෝම ශබ්ද නගන්න. දෙවියන්වහන්සේ යෙරිකෝව අපේ අත්වලට දුන්නා.

ඉශ්රායෙල්වරු: හහ් හහ් හ් හහ් හහ් හ්... හුරේ හුරේ නියමා යි...

| | |
|---|---|
| පොතේ ගුරා | ඔවුන් කෑ ගසද්දී යෙරිකෝවේ බිත්ති ඔක්කොම කඩාගෙන වැටුණා. ක්‍රාස්... ක්‍රාාස්... ක්‍රාාස් එහි සිටි හැම දෙනාම ඒකට යටවෙලා මැරුණා. නමුත් එදා ඔත්තුකාරයන් දෙදෙනාට උදව් කළ රාහබ් සහ ඇයගේ පවුලේ අයට දුන්න පොරොන්දුව අනුව දෙවියන්වහන්සේ ඔවුන්ව මුදවා ගත්තා. දෙවියන්වහන්සේට කීකරු වූ යෝෂුවා හා ඉශ්රායෙල්වරු අන්තිමට කානාන් දේශයට ඇතුල් වුණා. |
| | ........................................................................................ |
| ජීවිතයට අදාල කිරීම | දෙවියන්වහන්සේ මහ බලවත් දේවල් කරන සේක.<br>ඔයාගේ ජීවිතේ හැම අභියෝගයක්ම දෙවියන්වහන්සේට කියන්න.<br>උන්වහන්සේ හාස්කමක් කරයි.<br>දෙවියන්වහන්සේ විශ්වාස කරන්න. |